# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

---

**[සහතිකය සටහන් කළේ 2020 ඔක්තෝබර් මස 29 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2020 ඔක්තෝබර් මස 29 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 48.00 **තැපැල් ගාස්තුව :** රු. 35.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්. ඩී.—ඕ. 7/2020

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලෙස හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මේ පනතේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව, එහි (3අ)(අ)(i) වන අනුව්‍යවස්ථාවේ "වැඩිදුර කාලයක් සඳහා" යන වචන වෙනුවට "දෙවන ධුර කාලයක් සඳහා" යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

"ජනාධිපතිවරයාගේ බලතල හා කාර්ය.

33. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ යම් ලිඛිත නීතියකින් හෝ ප්‍රකාශිතව ම තමා වෙත පවරා හෝ නියම කර ඇත්තා වූ බලතලවලට සහ කාර්යයන්ට අමතරව, ජනාධිපතිවරයාට -

(අ) පාර්ලිමේන්තුවේ එක් එක් සැසිවාරය ආරම්භයෙහි පාර්ලිමේන්තුවේ දී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය කිරීමට බලය ඇත්තේ ය;

(ආ) පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම්වල මුලසුන දැරීමට බලය ඇත්තේ ය;

(ඇ) මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණයන් ඇති කිරීම තහවුරු කිරීම සඳහා බලය ඇත්තේ ය;

(ඇ) තානාපතිවරයන්, මහ කොමසාරිස්වරයන්, පූර්ණාධිකාරී රාජ්‍ය දූතයන් හා වෙනත් තානාපති නියෝජිතයන් පත් කිරීමට හා ඔවුන්ට බලතල පැවරීමට ද, ඔවුන් පිළිගැනීමට ද බලය ඇත්තේ ය;

(ඉ) නීතිඥ වෘත්තියෙහි විශිෂ්ටත්වයට පත්ව ඇත්තා වූ ද පැවැත්මෙහි හා වෘත්තීය කටයුතු පිළිබඳ අවංකභාවයෙහි උත්කෘෂ්ඨ තත්ත්වයක් පවත්වාගෙන ඇත්තා වූ ද නීතිඥවරයන් ජනාධිපති නීතිඥවරයන් වශයෙන් පත් කිරීමට බලය ඇත්තේ ය. මේ ඡේදය යටතේ පත් කරනු ලබන සෑම ජනාධිපති නීතිඥවරයකුටම ඒ දක්වා රාජ නීතිඥවරයන් විසින් භුක්ති විඳින ලද සියලු වරප්‍රසාදවලට හිමිකම ඇත්තේ ය;

(ඊ) ජනරජයේ රාජ්‍ය මුද්‍රාව භාරයේ තබා ගැනීමට ද අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන් ද ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙකුත් විනිශ්චයකාරවරයන් ද, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අනෙකුත් විනිශ්චයකාරවරයන් ද පත් කිරීමේ අධිකාර පත්‍රවල සහ ජනරජයට අයත් වූ ද ප්‍රදානය කිරීමට හා පවරා දීමට ද ජනාධිපතිවරයාට නීතියෙන් නියමව ඇත්තා වූ නැතහොත් බලය පැවරී ඇත්තා වූ ද ඉඩකඩම් හා නිශ්චල දේපළ ප්‍රදානය කිරීමේ දී හෝ පවරා දීමේ දී, ඒ සම්බන්ධ ප්‍රදාන පත්‍රවල හා පැවරුම් පත්‍රවල රාජ්‍ය මුද්‍රාව තබා අත්සන් කිරීමට ද රාජ්‍ය මුද්‍රාව තැබිය යුතු වෙනත් සෑම ලේඛනයකම රාජ්‍ය මුද්‍රාව තබා අත්සන් කිරීමට ද බලය ඇත්තේ ය;

(උ) යුද්ධ ප්‍රකාශ කිරීමට හා සාමය ප්‍රකාශ කිරීමට බලය ඇත්තේ ය; සහ

(උා) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට පටහැනි නොවන්නා වූ ද ජාත්‍යන්තර නීතිය, චාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ඔහුට නියමිතව හෝ බලය ලැබී ඇත්තා වූ ද සියලු ක්‍රියා හා දේ කිරීමට බලය ඇත්තේ ය.".

**4.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33අ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33අ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**5.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

"ජනාධිපතිවරයාට විරුද්ධව නඩු පැවරිය නොහැකි බව.

35. (1) ජනාධිපතිවරයා ලෙස ධුරය දරන කවර වූ හෝ තැනැත්තකු විසින් පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ නිල තත්ත්වයෙහි ලා හෝ කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක කිසිම නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුත්තේ ය:

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් ඔහුගේ නිල තත්වයෙහි ලා කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් නීතිපතිවරයාට විරුද්ධව 126 වන ව්‍යවස්ථාව යටතේ ඉල්ලීමක් කිරීමට යම් තැනැත්තකුට ඇති අයිතිය සීමා කරන ලෙස මේ අනුව්‍යවස්ථාවේ කිසිවක් කියවා තේරුම් නොගත යුත්තේ ය:

එසේම තවදුරටත්, ජනාධිපතිවරයා විසින් 33 වන ව්‍යවස්ථාවේ (උ) අනුව්‍යවස්ථාව යටතේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ බලය නොතිබිය යුත්තේ ය.

(2) කවර වූ හෝ තැනැත්තකුට විරුද්ධව නඩු පැවරීමේ දී නඩු පැවරිය හැකි කාලසීමාව නීතියෙන් නියම වී ඇති විට, ඒ කාලසීමාව තුළ ඒ තැනැත්තා යම් කිසි කාලයක් ජනාධිපති ධුරය දරා ඇත්නම් එකී නඩුව පැවරිය හැකි කාලසීමාව ඉකුත් වූයේ ද යන වග නිශ්චය කිරීමේ දී ඔහු ජනාධිපති ධුරය දැරූ කාලය නොගැනිය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලින් පැවරී ඇති මුක්තිය, 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට පවරා ඇති නැතහොත් ඔහුගේ භාරයේ තිබෙන යම් විෂයයකට හෝ කාර්යයකට සම්බන්ධ යම් බලයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව කවර වූ හෝ අධිකරණයක පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ 129 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම හා සම්බන්ධව හෝ ජනමත විචාරණයක වලංගුභාවය සම්බන්ධව 130 වන ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගැනීම හා සම්බන්ධව 144 වන ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ අදාළ නොවන්නේ ය:

එසේ වුව ද, ඒ යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වූ ඒ යම් නඩු කටයුත්තක් නීතිපතිවරයාට විරුද්ධව පැවරිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම.

**6.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ:-

“VIIඅ වැනි පරිච්ඡේදය

**විධායකය**

පාර්ලිමේන්තු සභාව

ජනාධිපතිවරයා විසින් උපලේඛනවල සඳහන් කොමිෂන් සභා සහ ධුර සම්බන්ධයෙන් පත්කිරීම් සිදු කරනු ලැබිය යුතු බව.

41අ. (1) මේ ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් ද, මේ ව්‍යවස්ථාවේ II වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සඳහන් ධුරවලට පත්කළ යුතු තැනැත්තන් ද, ජනාධිපතිවරයා විසින් ඒ කොමිෂන් සභාවලට සහ ධුරවලට පත්කරනු ලැබිය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් එකී පත්කිරීම් සිදුකිරීමේ දී-

(අ) අග්‍රාමාත්‍යවරයා;

(ආ) කථානායකවරයා;

(ඇ) විරුද්ධ පක්ෂයේ නායකවරයා;

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයකු; සහ

(ඉ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ නාමිකයකු,

යන අයගෙන් සමන්විත (මෙහි මින්මතු “සභාව” යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු සභාවක නිරීක්ෂණ ඉල්ලා සිටීම කළ යුත්තේ ය:

එසේ වුව ද, ඉහත (ඈ) සහ (ඉ) ඡේද ප්‍රකාර පත්කරනු ලබන තැනැත්තන් ඉහත (අ), (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව සඳහන් තැනැත්තන් අයත් වන ජන කොට්ඨාස නොවන්නා වූ ජන කොට්ඨාසවලට අයත්වන නාමිකයන් බව සහතික වන ආකාරයට නම් කළ යුත්තේ ය.

I වන උපලේඛනය

1. මැතිවරණ කොමිෂන් සභාව.

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

3. ජාතික පොලිස් කොමිෂන් සභාව.

4. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව.

6. මුදල් කොමිෂන් සභාව.

7. සීමා නිර්ණය කොමිෂන් සභාව.

**II වන උපලේඛනය**

I වන කොටස

1. අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්.

2. අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ විනිශ්චයකාරවරයන්.

3. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.

II වන කොටස

1. නීතිපතිවරයා.

2. විගණකාධිපතිවරයා.

3. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්).

4. පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා.

5. පොලිස්පතිවරයා.

(2) මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් සතියක කාලයක් ඇතුළත, ඒ නම් කිරීම් සිදු කරන මෙන්, අග්‍රාමාත්‍යවරයාට සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාට, කථානායකවරයා විසින් නියම

කරනු ලැබිය යුත්තේ ය; එසේ වුව ද, අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා, ඒ නම් කිරීම් සිදු කිරීම පැහැර හැරියහොත්, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානයේ නිශ්චිතව දක්වා ඇති උපමාන සැලකිල්ලට ගනිමින්, (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) සහ (ඉ) ඡේදවල කාර්ය සඳහා නාමිකයන් වශයෙන් පාර්ලිමේන්තුවේ යම් මන්ත්‍රීවරුන් නම් කිරීමට කථානායකවරයා විසින් කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

(3) (1) වන අනුව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් සභාවේ නිරීක්ෂණ ඉල්ලා සිටිනු ලබන අවස්ථාවේ දී, සභාවේ ඔවුන්ගේ නාමිකයන් විය යුතු තැනැත්තන් කවරහු ද යන්න නම් කිරීම අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් පැහැර හැර තිබේ නම්, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානයේ නිශ්චිතව දක්වා ඇති උපමාන සැලකිල්ලට ගනිමින්, (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) සහ (ඉ) ඡේදවල කාර්ය සඳහා නාමිකයන් වශයෙන් පාර්ලිමේන්තුවේ යම් මන්ත්‍රීවරුන් කථානායකවරයා විසින් නම් කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද, එය නොතකා, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ දී 64 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු කථානායකවරයා ලෙස තෝරා පත්කර ගනු ලබන තෙක්, කථානායකවරයා මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා කථානායකවරයා ලෙස නොකඩවා කටයුතු කළ යුත්තේ ය. ඉන්පසු අලුත් කථානායකවරයා සභාවේ සාමාජිකයකු විය යුත්තේ ය.

(5) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, ඉන් ඉක්බිතිව පවත්වනු ලබන මහ මැතිවරණයකින් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා ලෙස පිළිගනු ලබන තෙක්, විරුද්ධ පක්ෂයේ නායකවරයා මේ ව්‍යවස්ථාවේ

කාර්ය සඳහා විරුද්ධ පක්ෂයේ නායකවරයා ලෙස නොකඩවා ධුරය දැරිය යුත්තේ ය. ඉන්පසු අලුත් විරුද්ධ පක්ෂයේ නායකවරයා සභාවේ සාමාජිකයකු විය යුත්තේ ය.

(6) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, එය නොතකා, ඉන් ඉක්බිතිව පවත්වනු ලබන මහ මැතිවරණයකින් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට තෝරා පත්කර ගනු ලබන තෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වූ, අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ නාමිකයා සභාවේ සාමාජිකයන් ලෙස නොකඩවා කටයුතු කළ යුත්තේ ය. ඉන්පසු අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) සහ (ඉ) ඡේද ප්‍රකාර ඔවුන්ගේ නාමිකයන් ලෙස අලුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනකු පිළිවෙළින් නම් කරනු ලැබිය යුත්තේ ය.

(7) මේ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත සභාවේ නිල කාලය 62 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් යම් කාලයක් සඳහා දීර්ඝ විය යුත්තේ ය. තව ද, එම නිල කාලය කෙරෙහි 70 වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමක් මඟින් බලපෑමක් ඇති නොවිය යුත්තේ ය:

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් එකී නිල කාලය තුළ දී, අවස්ථාවෝචිත පරිදි, අග්‍රාමාත්‍යවරයා හෝ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් සිදුකරනු ලබන ඉල්ලීමක් මත, තත්කාර්යය සඳහා හේතු දක්වමින්, පිළිවෙළින් අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් නාමිකයන් ලෙස පත්කරනු ලැබූ තැනැත්තන් ඉවත් කිරීම හෝ එකී නාමිකයකුගේ අශක්නුතාවක් ඇති අවස්ථාවක, (1) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානයේ නිශ්චිතව දක්වා ඇති උපමාන සැලකිල්ලට ගනිමින් සභාවේ ඔහුගේ නාමිකයා ලෙස වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් කරන ලෙස ජනාධිපතිවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, අග්‍රාමාත්‍යවරයාට හෝ විරුද්ධ

පක්ෂයේ නායකවරයාට නියම කිරීම හෝ කරනු ලැබිය හැක්කේ ය. එවැනි අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඉවත් කිරීම හෝ අශක්නුතාව හෝ හේතුවෙන් නිර්මාණය වූ පුරප්පාඩුව පිරවීම සඳහා නම් කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින්, ඔහු නම් කරනු ලැබුවේ යම් සාමාජිකයකුගේ පුරප්පාඩුවක් පිරවීම සඳහා ද, සභාවේ එකී සාමාජිකයාගේ ඉකුත් නොවූ ධුර කාලය සඳහා පමණක් සභාවේ සාමාජිකයකු ලෙස නොකඩවා කටයුතු කළ යුත්තේ ය.

(8) (අ) ජනාධිපතිවරයා විසින් (1) වන අනුව්‍යවස්ථාව යටතේ සභාවේ නිරීක්ෂණ ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් එකී පත්වීම් සඳහා යෝජනා කරනු ලැබූ තැනැත්තන් පිළිබඳ සභාවේ නිරීක්ෂණ, එකී නිරීක්ෂණ ඉල්ලා සිටීමේ දින සිට සතියක කාලපරිච්ඡේදයක් තුළ කථානායකවරයා මඟින් ඔහුට එවන ලෙස ජනාධිපතිවරයා විසින් සභාවට නියම කරනු ලැබිය යුත්තේ ය.

(ආ) සභාව විසින් එහි නිරීක්ෂණ (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලය තුළ ජනාධිපතිවරයාට දැන්වීම පැහැර හැරියහොත්, ජනාධිපතිවරයා විසින් වහාම එකී පත්වීම් සිදු කිරීමට කටයුතු කළ යුත්තේ ය.

(9) පාර්ලිමේන්තුව තුළ නියෝජනය වන්නා වූ යම් පිළිගත් දේශපාලන පක්ෂයක නායකයකු විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ ලෙස යම් තැනැත්තකුගේ නම යෝජනා කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් සභාවේ නිරීක්ෂණ ඉල්ලා සිටිනු ලැබූ දින සිට සතියක කාල පරිච්ඡේදයක් තුළ එයට අදාළව යම් තැනැත්තකුගේ නම ඔහු විසින් කථානායකවරයාට ඉදිරිපත් කළ හැක්කේ ය. ඒ පත්වීම් කරනු ලබන විට ජනාධිපතිවරයා විසින් එකී නම් සැලකිල්ලට ගනු ලැබිය හැක්කේ ය.

(10) මේ ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තකු හෝ මේ ව්‍යවස්ථාවේ II වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සඳහන් ධුරවලට පත් කරනු ලැබූ යම් තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හෝ එකී කාර්යය සඳහා පනවන ලද වෙනත් යම් නීතියකින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට හෝ හැර ඉවත් නොකළ යුත්තේ ය. එවැනි විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක එකී තැනැත්තා ජනාධිපතිවරයා විසින් ඉවත් කළ යුත්තේ ය.

(11) (අ) කථානායකවරයා සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.

(ආ) සභාවේ නිරීක්ෂණ ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය කථානායකවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට විය යුත්තේ ය.

(12) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මඟින් පනවනු ලැබිය හැකි පරිදි වූ හෝ පවරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් යම් කාර්ය සහ කර්තව්‍ය සභාව විසින් කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුත්තේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වන පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම.

**7.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වන පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ:-

### “VIII වැනි පරිච්ඡේදය

### විධායකය

### අමාත්‍ය මණ්ඩලය

ජනාධිපතිවරයාගේ වගකීම්.

42. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිය ඇතුළු වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ද ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සහ යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය.

අමාත්‍ය මණ්ඩලය.

43. (1) ජනරජයේ පාලනය මෙහෙයවීම සහ ඒ පාලනය පිළිබඳ විධානය භාර අමාත්‍ය මණ්ඩලයක් වන්නේ ය. අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට සහ උත්තර දීමට බැඳී සිටින්නේ ය.

(2) ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් ද අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ද වන්නේ ය:

එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසිර ගිය ද ජනාධිපතිවරයා තවදුරටත් තම ධුරය දරන්නේ ය.

(3) පාර්ලිමේන්තුවේ යම්කිසි මන්ත්‍රීවරයකු කෙරෙහි පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම පමණින් ඇතැයි ජනාධිපතිවරයාගේ මතය වන්නේ නම් ජනාධිපතිවරයා විසින් ඒ මන්ත්‍රීවරයා අග්‍රාමාත්‍ය ධුරයට පත් කළ යුත්තේ ය.

අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සහ ඔවුන්ගේ විෂය සහ කාර්ය.

44. (1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි දී අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින් කලින් කල -

(අ) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද අමාත්‍යාංශ සංඛ්‍යාව ද ඒ අමාත්‍යවරයන්ට පවරන විෂය සහ කාර්ය ද නිශ්චය කළ යුත්තේ ය; තවද

(ආ) එසේ නිශ්චය කරනු ලබන අමාත්‍යාංශ භාරව කටයුතු කිරීම සඳහා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතරින් අමාත්‍යවරයන් පත් කළ යුත්තේ ය.

(2) ජනාධිපතිවරයා විසින් යම් විෂයයක් හෝ කාර්යයක් තමාට ම පවරා ගැනීම කළ හැකි අතර මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ හෝ 45 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ හෝ යම්

අමාත්‍යවරයකුට පවරනු නොලැබූ යම්කිසි විෂයයක් හෝ කාර්යයක් භාරව සිටිය යුත්තේ ය. තව ද, තත් කාර්යය සඳහා තමා භාරයේ තිබිය යුතු අමාත්‍යාංශ සංඛ්‍යාව නිශ්චය කිරීම ද කළ හැක්කේ ය. ඒ අනුව, ඒ විෂයය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍යවරයා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ ඇති සඳහනක් ජනාධිපතිවරයා සම්බන්ධයෙන් වූ සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුත්තේ ය.

(3) ජනාධිපතිවරයා විසින් කවර අවස්ථාවක දී වුව ද, අමාත්‍ය මණ්ඩලය වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම ද කරනු ලැබිය හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ පාර්ලිමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩලය දරන වගකීමේ අඛණ්ඩ පැවැත්මට එවැනි වෙනස් කිරීමක් බල නොපාන්නේ ය.

අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්, ඔවුන්ගේ අමාත්‍යාංශ, විෂය සහ කාර්ය

45. (1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි දී අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින් කලින් කල -

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතරින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය; තව ද

(ආ) ඒ අමාත්‍යවරයන්ට පැවරිය යුතු විෂය සහ කාර්ය ද ඔවුන්ට යම් අමාත්‍යාංශ භාර කරනු ලබන්නේ නම් ඒ අමාත්‍යාංශ ද නිශ්චය කළ හැක්කේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ කරන ලද යම් පත් කිරීමක් හෝ විෂය සහ කාර්ය පැවරීමක් ජනාධිපතිවරයා විසින් කවර අවස්ථාවක දී වුව ද වෙනස් කරනු ලැබිය හැක්කේ ය.

(3) මේ ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද සෑම අමාත්‍යවරයෙක් ම අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට වගකීමට සහ උත්තර දීමට බැඳී සිටින්නේ ය.

(4) අමාත්‍ය මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු වෙත පවරා ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම්කිසි බලයක් හෝ කාර්යයක් හෝ යම්කිසි ලිඛිත නීතියකින් පැවරී ඇත්තා වූ හෝ නියම වී ඇත්තා වූ යම්කිසි බලයක් හෝ කාර්යයක් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍ය මණ්ඩලයේ ඒ අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට පවරා දිය හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ ඒ අමාත්‍යවරයාට ඒ බලය හෝ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද, මේ අනුව්‍යවස්ථාව යටතේ එකී වෙනත් අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබූ යම්කිසි බලයක් හෝ කාර්යයක් ඒ වෙනත් අමාත්‍යවරයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

නියෝජ්‍ය අමාත්‍යවරයන්.

46. (1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි දී අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ට ඔවුන්ගේ කාර්ය ඉටුකිරීමෙහිලා සහාය වීම පිණිස පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතරින් නියෝජ්‍ය අමාත්‍යවරයන් කලින් කල පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) අමාත්‍ය මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු වෙත පවරා ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් කිසි බලයක් හෝ කාර්යයක් හෝ යම්කිසි ලිඛිත නීතියකින් පැවරී ඇත්තා වූ හෝ නියම වී ඇත්තා වූ යම්කිසි බලයක් හෝ කාර්යයක් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ඒ අමාත්‍යවරයා විසින් ස්වකීය නියෝජ්‍ය අමාත්‍යවරයාට පවරා දිය හැක්කේ ය.

එකී අමාත්‍යවරයාට ඒ බලය හෝ ඒ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද, මේ අනුව්‍යවස්ථාව යටතේ එකී නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබූ යම්කිසි බලයක් හෝ කාර්යයක්, ඒ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

අග්‍රාමාත්‍යවරයාගේ, අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ ධුර කාලය සහ අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව සීමා කිරීම.

47. (1) (අ) අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරයන් සංඛ්‍යාව තිහ නොඉක්මවිය යුතු ය; සහ

(ආ) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාවේ එකතුව හතළිහ නොඉක්මවිය යුතු ය.

(2) අග්‍රාමාත්‍යවරයා හෝ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙක් හෝ වෙනත් යම් අමාත්‍යවරයෙක් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙක් -

(අ) ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවන ලිපියක් මගින් ඉවත් කරනු ලැබුවහොත්;

(ආ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් අස්වුවහොත්; හෝ

(ඇ) තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවුවහොත්,

මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම්තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවත්නේ ද ඒ තාක් කල් ස්වකීය ධුරය දරන්නේ ය.

(3) (1) වන අනුව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුව ද, පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබා ගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන

කණ්ඩායම හෝ විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවේ දී, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් සංඛ්‍යාව ද නියෝජ්‍ය අමාත්‍යවරයන් සංඛ්‍යාව ද පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(4) (3) වන අනුව්‍යවස්ථාවේ කාර්යය සඳහා "ජාතික ආණ්ඩුවක්" යනු පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාව ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සහ පාර්ලිමේන්තුවේ අනෙකුත් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් එක්ව පිහිටුවනු ලබන ආණ්ඩුවක් වන්නේ ය.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති කාලය තුළ අමාත්‍ය මණ්ඩලය.

48. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන තෙක් ක්‍රියා කළ අමාත්‍ය මණ්ඩලය, පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද දිගටම ක්‍රියා කළ යුතු අතර, මහ මැතිවරණය අවසාන වූ විට එසේ ක්‍රියා කිරීම නතර කළ යුත්තේ ය. ඒ අනුව, අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද වෙනත් අමාත්‍යවරයන් ද නියෝජ්‍ය අමාත්‍යවරයන් ද, 47 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි ධුර දැරීම නතර වුවහොත් මිස, දිගටම ක්‍රියා කළ යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා මිය ගියේ වුව ද, ධුරයෙන් ඉවත් කරනු ලැබුයේ වුව ද, අස්වූයේ වුව ද, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කරන්නේ ය. තව ද, අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතරින් යම් අමාත්‍යවරයකු පත් කරනු ලැබිය හැක්කේ ය. නැතහොත් ඒ බලතල, කාර්ය හා කර්තව්‍ය ජනාධිපතිවරයා විසින් ම ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ වෙනත්

අමාත්‍යවරයෙක් නොසිටී නම් මහ මැතිවරණය අවසාන වන තෙක්, අමාත්‍ය මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ජනාධිපතිවරයා විසින් ම ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුත්තේ ය.

(3) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු හෝ වෙනත් යම් අමාත්‍යවරයකු හෝ මිය ගිය විට, ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ ඉල්ලා අස් වූ විට ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය භාරව කටයුතු කිරීමට හෝ ඒ අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට වෙනත් කවර වූ හෝ අමාත්‍යවරයකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය. නැතහොත් ජනාධිපතිවරයා විසින් ම ඒ අමාත්‍යාංශය භාරව කටයුතු කිරීම හෝ ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය තමා විසින් ම ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැක්කේ ය.

අමාත්‍ය මණ්ඩලය විසිරීම.

49. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ හැර, මිය යාමෙන්, ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් අග්‍රාමාත්‍යවරයා ධුරය දැරීම නතර වූ විට, 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇතොත් මිස, අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේ ය. එසේ වූ විට, ජනාධිපතිවරයා විසින් 43 වන, 44 වන, 45 වන සහ 46 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයකු ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද වෙනත් අමාත්‍යවරයන් ද නියෝජ්‍ය අමාත්‍යවරයන් ද පත් කළ යුත්තේ ය:

එසේ වුව ද, ඉහත කී පරිදි අග්‍රාමාත්‍යවරයා ධුරය දැරීම නතර වීමෙන් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත්, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කළ යුත්තේ ය. තව ද, අග්‍රාමාත්‍යවරයාගේ බලතල,

කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතරින් යම් අමාත්‍යවරයකු පත් කරනු ලැබිය හැක්කේ ය; නැතහොත් ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය ජනාධිපතිවරයා විසින් ම ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැක්කේ ය. තව ද, 48 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(2) පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත් කෙටුම්පත හෝ ප්‍රතික්ෂේප කළහොත් එවිට ද ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් සම්මත කළහොත් එවිට ද අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේ ය. එසේ වූ විට 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත් මිස, ජනාධිපතිවරයා විසින් 43 වන, 44 වන, 45 වන සහ 46 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයකු ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද වෙනත් අමාත්‍යවරයන් ද නියෝජ්‍ය අමාත්‍යවරයන් ද පත් කළ යුත්තේ ය.

වැඩ බලන අමාත්‍යවරයා හා වැඩ බලන නියෝජ්‍ය අමාත්‍යවරයා.

50. අමාත්‍ය මණ්ඩලයේ යම් කිසි අමාත්‍යවරයකුට හෝ වෙනත් අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ සිය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වුවහොත්, එවිට එකී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ හෝ වෙනත් අමාත්‍යවරයාගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ හෝ ධුරයේ වැඩ බැලීමට පාර්ලිමේන්තුවේ කවර වූ හෝ මන්ත්‍රීවරයකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.

අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා සහ අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා.

51. (1) (අ) අග්‍රාමාත්‍යවරයාට, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(ආ) අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා විසින්, අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලය භාරව කටයුතු කිරීම සහ අග්‍රාමාත්‍යවරයාගේ විධානයන්ට යටත්ව, ස්වකීය

ධුරයේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සහ කිරීම කළ යුත්තේ ය.

(2) අමාත්‍ය මණ්ඩලයට ලේකම්වරයෙක් වන්නේ ය. ජනාධිපතිවරයා විසින් ලේකම්වරයා පත් කරනු ලබන්නේ ය. ජනාධිපතිවරයාගේ විධානයන්ට යටත්ව අමාත්‍ය මණ්ඩල කාර්යාලය භාරව එහි කටයුතු කිරීමත් ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ පවරනු ලබන්නා වූ වෙනත් යම්කිසි කර්තව්‍ය හෝ කාර්ය හෝ වේ නම් ඒ කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීමත් ලේකම්වරයා විසින් කරනු ලැබිය යුත්තේ ය.

අමාත්‍යාංශයන්හි ලේකම්වරයන්.

52. (1) එක් එක් අමාත්‍යාංශයට ලේකම්වරයෙක් වන්නේ ය. ජනාධිපතිවරයා විසින් ඒ ලේකම්වරයා පත් කරනු ලබන්නේ ය.

(2) අමාත්‍යාංශයේ ලේකම්වරයා ස්වකීය අමාත්‍යවරයා භාරයේ ඇති ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ද වෙනත් ආයතන ද, ස්වකීය අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත්ව, මෙහෙයවන්නේ ය.

(3) යම් අමාත්‍යාංශයක ලේකම්වරයා ධුරය දැරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසිර ගිය විට හෝ ඒ අමාත්‍යාංශයේ පැවැත්ම නතර වීමේ ප්‍රතිඵලය ඇති තීරණයක් 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලැබූ විටක හෝ නතර විය යුත්තේ ය.

(4) අමාත්‍යාංශයක ලේකම්වරයා ධුරය දැරීම එසේ නතර වූ අවස්ථාවක අමාත්‍ය මණ්ඩලය විසින් ඒ ලේකම්වරයා රජයේ සේවයේ වෙනත් යම්කිසි තනතුරකට පත් කරනු ලැබිය හැක්කේ ය:

එසේ වුව ද, ලේකම් ධුරයට පත් කරනු ලැබීමට පෙරාතුව ම රජයේ සේවයෙහි හෝ පළාත් පාලන සේවයෙහි හෝ යම්කිසි රාජ්‍ය සංස්ථාවක සේවයෙහි යෙදී සිටි තැනැත්තකු ඒ සේවයෙන් තාවකාලිකව මුදා හරිනු ලැබුවාක් සේ සැලකිය යුතු අතර, ලේකම්වරයකු වශයෙන් ධුරය දැරීම

නතර වූ විට ඒ තැනැත්තාට ජ්‍යෙෂ්ඨතාවය අහිමිවීමක් නොමැතිව එකී සේවයට ආපසු පැමිණීමට හිමිකම තිබිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානය, අමාත්‍යාංශයක ලේකම්වරයකුට පහත සඳහන් අවස්ථාවල දී, එනම් -

(අ) විනය හේතු මත සේවයෙන් පහ කිරීම නොවන වෙනත් ආකාරයකින් ජනාධිපතිවරයා විසින් ඒ ලේකම්වරයාගේ සේවය අවසාන කළ විට; හෝ

(ආ) ඒ ලේකම්වරයා ඉල්ලා අස්වන දිනයේ දී ඔහුට විරුද්ධව විනය පිළිබඳ කටයුත්තක් විභාගයට භාජනව ඇත්නම් හෝ එය විභාගයට ගැනීමට අදහස් කර ඇත්නම් මිස, ඔහු ඉල්ලා අස් වූ විට,

අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(6) ජනාධිපතිවරයාගේ ලේකම් ධුරය හෝ යම්කිසි අමාත්‍යාංශයක ලේකම් ධුරය හෝ ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ යම් කිසි ධුරයක් හෝ ඒ ධුර එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නොකඩවා දරා ඇති කවර වූ හෝ තැනැත්තකු අවසන් වරට දැරූ ධුරය ඔහු විසින් නොකඩවා දැරූ සේ මේ ව්‍යවස්ථාවේ (4) වන සහ (5) වන අනුව්‍යවස්ථාවල කාර්ය සඳහා සැලකිය යුත්තේ ය.

(7) මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා -

(අ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යාලය ද, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද, මැතිවරණ කොමිෂන් සභාව ද, ජාතික පොලිස් කොමිෂන් සභාව ද, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යාලය ද; සහ

(ආ) ජාතික විගණන කාර්යාලය ද,

ආණ්ඩුවේ දෙපාර්තමේන්තු නොවන්නාක් සේ සැලකෙන්නේ ය.

නිල ප්‍රතිඥාව හෝ දිවුරුම.

53. මේ පරිච්ඡේදයේ දැක්වෙන යම් කිසි ධුරයකට පත් කරනු ලැබූ තැනැත්තකු හතරවන උපලේඛනයේ සහ හත්වන උපලේඛනයේ දක්වෙන ප්‍රතිඥා දී ඊට අත්සන් තබන තෙක් හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් හෝ ස්වකීය ධුරයට අයත් කාර්යන්හි නොයෙදිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(1) 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුට නොඅඩු සහ නව දෙනෙකුට නොවැඩි සාමාජිකයන්ගෙන් සමන්විත (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විය යුතු අතර, එකී සාමාජිකයන් අතරින් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුත්තේ ය.";

(2) ඒ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධව අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත්" යන වචන වෙනුවට "ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධව අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාවේ "ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන වෙනුවට "ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන්, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඈ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**9.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඈ වන ව්‍යවස්ථාවේ, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවන සහ හත්වන උපලේඛනවල දක්වා ඇති ප්‍රතිඥා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඉ වන සහ 61ඊ වන ව්‍යවස්ථා ප්‍රතියෝජනය කිරීම.

**10.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඉ වන සහ 61ඊ වන ව්‍යවස්ථා මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථා ආදේශ කරනු ලැබේ:-

"ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත් කිරීම්.

61ඉ. ජනාධිපතිවරයා විසින් -

(අ) යුධ හමුදාපතිවරයා, නාවුක හමුදාපතිවරයා සහ ගුවන් හමුදාපතිවරයා පත් කිරීම ද;

(ආ) 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, නීතිපතිවරයා සහ පොලිස්පතිවරයා පත් කිරීම ද,

කළ යුත්තේ ය.

අර්ථ නිරූපනය.

61ඊ. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා, "රජයේ නිලධරයා" යන්නට යුධ හමුදා, නාවුක හමුදා හෝ ගුවන් හමුදා සාමාජිකයකු හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයකු හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපලේඛනගත රජයේ නිලධරයකු ඇතුළත් නොවන්නේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**11.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(1) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයෙක් වන්නේ ය. මහ ලේකම්වරයා, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය. මහ ලේකම්වරයා යථා පැවැත්මෙන් සිටිනා තාක් ස්වකීය ධුරය දරන්නේ ය.";

(2) ඒ ව්‍යවස්ථාවේ (6) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(6) මහ ලේකම්වරයාට සිය ධුරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි වූ විට මහ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට තැනැත්තකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**12.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශනයක් මගින් පාර්ලිමේන්තුව කැඳවීම, පාර්ලිමේන්තුවේ වාරාවසාන කිරීම සහ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම කළ හැක්කේ ය:

එසේ වුව ද -

(අ) (ඇ) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුව ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියහොත් මිස, ඒ පාර්ලිමේන්තුව පළමු වරට රැස්වීමට නියමිත දින සිට අවුරුදු දෙකකුත් මාස හයකට නොඅඩු කාලසීමාවක් ඉකුත් වන තෙක් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා නොහැරිය යුත්තේ ය;

(ආ) මහ මැතිවරණයකින් ඉක්බිතිව පැවැත්වෙන පාර්ලිමේන්තුවේ පළමුවන වාරය ආරම්භයේ දී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රතික්ෂේප කරනු ලැබූ විටක දී ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා නොහැරිය යුත්තේ ය;

(ඇ) (ඈ) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, 38 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (අ) සහ (ආ) ඡේදවල නියමයන්ට අනුකූල වන යෝජනා සම්මතයක් කථානායකවරයා විසින් භාර ගැනීමෙන් පසුව -

(i) ඒ යෝජනා සම්මතය 38 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයෙහි නියමිත පරිදි සම්මත නොවුවහොත් මිස;

(ii) ස්වකීය ධුරයට අයත් කාර්ය ඉටු කිරීමට නියත වශයෙන් ම නොහැකි තත්ත්වයකට ජනාධිපතිවරයා පත්ව නැතැයි හෝ ඒ යෝජනා සම්මතයේ ඇතුළත් වෙනත් කිසිම චෝදනාවකටවත් ජනාධිපතිවරයා වරදකරු වී නැතැයි හෝ ශ්‍රේෂ්ඨාධිකරණය නිශ්චය කර වාර්තා කළහොත් මිස;

(iii) ජනාධිපතිවරයා ඉවත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද එකී යෝජනා සම්මතය 38 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ නියමිත පරිදි සම්මත නොවුවහොත් මිස; හෝ

(iv) පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියහොත් මිස,

ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා නොහැරිය යුත්තේ ය ;

(ඈ) පාර්ලිමේන්තුව විසින් විසර්ජන පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු නොලැබූ අවස්ථාවක ඊළඟ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුත්තේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**13.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(1) සෑම පනත් කෙටුම්පතක් ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යටත් පිරිසෙයින් දවස් හතකට පෙර ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේ ය."; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන්:-

"(3) පනත් කෙටුම්පතකට පාර්ලිමේන්තුව තුළ දී යෝජනා කරනු ලබන යම් සංශෝධනයක් ඒ පනත් කෙටුම්පතේ හරයට සහ මූලධර්මවලට පරිබාහිර සංශෝධනයක් නොවිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**14.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලද (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම හෝ සඳහා වූ පනත් කෙටුම්පතක් නොවන නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යම් විධිවිධානයක් එකතු කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් නොවන, එසේත් නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් නොවන හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් කිසි විධිවිධානයකට අනනුකූල පනත් කෙටුම්පතක් නොවන) පනත් කෙටුම්පතක් ජනාධිපතිවරයා විසින් ස්වකීය අභිමතය පරිදි ජනමත විචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කළ හැක්කේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**15.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (iv) වන, (ivඅ) වන, (v) වන, (vඅ) වන සහ (vආ) වන අයිතම ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන්:-

"(iv) 41අ වන ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් යම් කොමිෂන් සභාවක සාමාජිකයකු,

(v) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවක සාමාජිකයකු,

(vඅ) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා,";

(2) ඒ ඡේදයේ (xiii) වන අයිතමය ඉවත් කිරීමෙන්.

**16.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ "තිස්පහ" යන වචනය වෙනුවට "තිහ" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**17.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ "(1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව" යන වචන සහ ඉලක්කම වෙනුවට "(1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සහ 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**18.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(1) (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මැතිවරණ කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. කොමිෂන් සභාව, යම් වෘත්තියක හෝ පරිපාලනය හෝ අධ්‍යාපනය යන ක්ෂේත්‍රයක විශිෂ්ඨතා හිමිකරගෙන සිටින තැනැත්තන් අතරින්, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය. එසේ පත්කරනු ලබන එක් සාමාජිකයකු නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයකු වශයෙන් හෝ ඊට ඉහළ වූ හෝ ධුරයක් දරනු ලැබූ මැතිවරණ දෙපාර්තමේන්තුවේ හෝ මැතිවරණ කොමිෂන් සභාවේ විශ්‍රාමලත් නිලධරයකු විය යුත්තේ ය. ඔවුන් අතරින් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.";

(2) ඒ ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(7) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට කොමිෂන් සභාවට අදාළ ඔහුගේ රාජකාරි කටයුතුවලින් මාස දෙකක් නොඉක්මවන කාලයක් සඳහා රාජකාරි නිවාඩු දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු ඒ නිවාඩු කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු වශයෙන්, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පත් කරනු ලැබිය හැක්කේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**19.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (4)(අ) අනුව්‍යවස්ථාවේ (i) වන ඡේදයේ "තරග කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ" යන වචන වෙනුවට "තරග කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන්:-

"(4අ) කොමිෂන් සභාව විසින්, අවස්ථාවෝචිත පරිදි, මැතිවරණයක් පැවැත්වීම සඳහා නියමයක් කරනු ලබන දිනයෙන් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම නියම කරමින් ප්‍රකාශනයක් කරනු ලබන දිනයෙන් හෝ ආරම්භ වන කාල පරිච්ඡේදය තුළ නිකුත් කරනු ලබන යම් උපමාන-

(අ) අවස්ථාවෝචිත පරිදි, අදාළ මැතිවරණය පැවැත්වීම සමග හෝ අදාළ ජනමත විචාරණය පැවැත්වීම සමග හෝ ඍජුව සම්බන්ධ වූ කාරණාවලට පමණක් සීමා විය යුතු බව; සහ

(ආ) රාජ්‍ය සේවයට අදාළ යම් කාරණයකට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ

පරිපාලන සීමාව ඇතුළත වූ යම් කාරණයකට හෝ ඍජුව සම්බන්ධ නොවිය යුතු බව,

සැක දුරුකිරීම සඳහා මෙයින් සඳහන් කරනු ලැබේ.";

(3) ඒ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) යම් ගුවන්විදුලි සේවයක් හෝ රූපවාහිනී සේවයක් පවත්වාගෙන යන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු නැතහොත් ප්‍රකාශකයකු හෝ විසින් (අ) ඡේදය යටතේ ඔවුන් වෙත නිකුත් කරනු ලැබූ යම් උපමාන පිළිපැදීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම, අවස්ථාවෝචිත පරිදි, එකී ගුවන්විදුලි සේවය හෝ රූපවාහිනී සේවය පවත්වාගෙන යන්නාගේ හෝ ප්‍රවෘත්ති පත්‍රයේ අයිතිකරුගේ නැතහොත් ප්‍රකාශකයාගේ හෝ කාර්යය වන්නේ ය.".

**20.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(1) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙක් සිටිය යුත්තේ ය. ඒ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු නියම සහ කොන්දේසි මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.'';

(2) ඒ ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) ඔහු වයස අවුරුදු හැට සම්පූර්ණ කළ විට;".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**21.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) අග්‍ර විනිශ්චයකාරවරයා ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ වෙනත් සෑම විනිශ්චයකාරවරයෙක් ද, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලැබිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**22.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:-

"වැඩබැලීමේ පත්වීම්.

109. (1) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට අග්‍ර විනිශ්චයකාරවරයා හෝ අභියාචනාධිකරණයේ සභාපතිවරයා හෝ තාවකාලිකව අපොහොසත් වේ නම්, ඒ කාලසීමාව තුළ පිළිවෙළින් අග්‍ර විනිශ්චයකාර ධුරයේ හෝ අභියාචනාධිකරණයේ සභාපති ධුරයේ හෝ වැඩ බැලීම සඳහා 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රේෂ්ඨාධිකරණයේ නැතහොත් අභියාචනාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයකු පත් කළ යුත්තේ ය.

(2) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් යම් විනිශ්චයකාරවරයකු හෝ අභියාචනාධිකරණයේ වෙනත් යම් විනිශ්චයකාරවරයකු හෝ තාවකාලිකව අපොහොසත් වේ නම්, ඒ කාලසීමාව තුළ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන්

හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් හෝ වැඩ බැලීම සඳහා වෙනත් විනිශ්චයකාරවරයකු, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**23.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන" යන වචන වෙනුවට "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**24.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (5) වන සහ (6) වන අනුව්‍යවස්ථා ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථා ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට, ඔහුගේ කාර්යන්ගෙන් නිවාඩු දෙනු ලැබිය හැකි අතර, එසේ නිවාඩු දෙන ලද කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු වශයෙන්, කොමිෂන් සභාවේ සාමාජිකයකු වීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තකු, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

(6) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**25.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "දස දෙනකුට නොවැඩි වෙනත් විනිශ්චයකාරවරයන් සංඛ්‍යාවකගෙන් ද" යන වචන වෙනුවට "දහසය දෙනකුට නොවැඩි වෙනත් විනිශ්චයකාරවරයන් සංඛ්‍යාවකගෙන් ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 122 වන අලුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

**26.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථාව මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන ව්‍යවස්ථාව ලෙස බලපැවැත්විය යුතු යː-

"හදිසි පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය විශේෂයෙන් ක්‍රියාත්මක කිරීම.

122. (1) අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ ආපදා කළමනාකරණයට අදාළ යම් කාරණයක කාර්යය සඳහා වහා අවශ්‍ය වන්නා වූ ද ඒ බවට අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ අත්සන ඇති සටහනක් දරන්නා වූ ද පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් -

(අ) මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, 78 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන සහ 121 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවන්නේ ය ;

(ආ) ඒ පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන්න පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ තීරණය අග්‍ර විනිශ්චයකාරවරයා අමතා යවන ලිඛිත යොමු කිරීමක් මගින් ජනාධිපතිවරයා විසින් ඉල්ලා සිටිය යුත්තේ ය. ඒ යොමු කිරීමේ පිටපතක් ඒ අවස්ථාවේ දී ම කථානායකවරයා වෙත භාර දිය යුත්තේ ය ;

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණය කැඳවනු ලැබ පැය විසිහතරක් ඇතුළත (හෝ ජනාධිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ඊට වැඩි, එහෙත් දවස් තුනක් නොඉක්මවන කාලයක් ඇතුළත) ඒ අධිකරණය විසින් ස්වකීය තීරණයට එළඹිය යුත්තේ ය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ තීරණය ජනාධිපතිවරයාට සහ කථානායකවරයාට පමණක් දැනුම් දිය යුත්තේ ය.

(2) 121 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ පනත් කෙටුම්පතට අදාළ වන්නේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් විධිවිධානයක් සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම සහ ප්‍රතියෝජනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම පිණිස වූ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම සහ ප්‍රතියෝජනය කිරීම පිණිස වූ යම් පනත් කෙටුම්පතකට මේ ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**27.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(3) 122 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි සටහනක් කරන ලද පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් වූ විට, ඒ පනත් කෙටුම්පත හෝ පනත් කෙටුම්පතේ යම් විධිවිධානයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන සැකයක් ශ්‍රේෂ්ඨාධිකරණය පළ කළහොත් ඒ පනත් කෙටුම්පත හෝ පනත් කෙටුම්පතේ ඒ විධිවිධානය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි තීරණය කරනු ලැබුවාක් සේ සලකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන සහ (2) වන අනුව්‍යවස්ථාවල විධිවිධාන අනුව ක්‍රියා කළ යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 124 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**28.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 124 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ "120 වැනි සහ 121 වැනි ව්‍යවස්ථාවල විධිවිධාන සලසා ඇති පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "120 වන, 121 වන සහ 122 වන ව්‍යවස්ථාවල විධිවිධාන සලසා ඇති පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 128 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**29.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 128 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුව්‍යවස්ථාව එකතු කිරීමෙන් ඒ ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) මේ ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද, අභියාචනය කිරීම සඳහා අවසරය හෝ විශේෂ අවසරය ප්‍රදානය කරන ලෙසට වූ ඉල්ලීමක් සඳහා, අවස්ථාවෝචිත පරිදි, අවසරය ප්‍රදානය කිරීම හෝ ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් දෙදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් කළ හැක්කේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 134 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**30.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 134 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "121 වැනි, 125 වැනි," යන වචන සහ ඉලක්කම් වෙනුවට "121 වන, 122 වන, 125 වන," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 137 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**31.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 137 වන ව්‍යවස්ථාවේ "එකොළොස් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් ද" යන වචන වෙනුවට "දහනව දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**32.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(1) විගණකාධිපතිවරයෙක් වන්නේ ය. විගණකාධිපතිවරයා සුදුසුකම් ලත් විගණකවරයකු විය යුතු අතර, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය. විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධුරය දරන්නේ ය.";

(2) ඒ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(4) විගණකාධිපතිවරයාට සිය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට නොහැකි වූ විට විගණකාධිපතිවරයා වෙනුවෙන් වැඩ බැලීමට 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව සුදුසුකම් ලත් විගණකවරයකු පත් කිරීමට ජනාධිපතිවරයාට හැක්කේ ය. ".

**33.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**34.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ආ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ආ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**35.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඇ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඇ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**36.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඈ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඈ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**37.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඉ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඉ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**38.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඊ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඊ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**39.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153උ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153උ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**40.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඌ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඌ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**41.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ කාර්යාල", යන වචනවල සිට ඒ අනුව්‍යවස්ථාවේ අවසානය දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට "අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යාලය, 44 වන හෝ 45 වන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, පාර්ලිමේන්තු සභාව, 41අ වන ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද, ඒවායේ ගිණුම් ද ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේ ය". යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**42.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) එක් එක් තැනැත්තා මූල්‍ය, නීතිය, පරිපාලනය, ව්‍යාපාර හෝ ශාස්ත්‍රීය යන ක්ෂේත්‍රයක කැපී පෙණුනු හෝ උසස් නිලතල දැරූ හෝ තැනැත්තන් විය යුතු වූ ද ප්‍රධාන ජන වර්ග තුන නියෝජනය කිරීම සඳහා, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද වෙනත් සාමාජිකයන් තිදෙනෙක්.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**43.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(1) 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුට නොඅඩු සහ සාමාජිකයන් හත් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික

පොලිස් කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය."; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(4) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ යම් නුසුදුසුකමකට පත් වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයයෙහි අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් හෝ මේ ව්‍යවස්ථාවේ (6) වන අනුව්‍යවස්ථාව යටතේ ඔහු සිය ධුරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.".

**44.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ආ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ආ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "සාමාජිකයන් හතර දෙනකු විය යුත්තේ ය." යන වචන වෙනුවට "සාමාජිකයන් පස් දෙනකු විය යුත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාව ඉවත් කිරීමෙන්.

**45.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඇ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ "126 වන ව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දී ඇති බලයට යටත්ව සහ 155ඔ වන ව්‍යවස්ථාව මගින් පරිපාලනය අභියාචන විනිශ්චය අධිකාරය වෙත ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "126 වන ව්‍යවස්ථාවේ (1) වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඇ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

අනුව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දී ඇති බලයට යටත්ව" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**46.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක හෝ" යන වචනවල සිට "වරදකට වරදකරු වන අතර" යන වචන දක්වා වන සියලු වචන ඉවත් කර ඒ වෙනුවට, "කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක හෝ යම් තීරණයකට කෙළින්ම හෝ වක්‍රාකාරයෙන් හෝ තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මඟින් හෝ වෙනත් යම් තැනැත්තකු සමඟ එක් වී හෝ කවර වුව ද ආකාරයකින් බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට තැත් කරන හෝ අයුතු ලෙස මැදිහත් වන හෝ කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක සාමාජිකයකු වෙත එසේ බලපෑම් කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර" යන වචන ආදේශ කිරීම මඟින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 155ඊඊ වන අලුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

**47.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊ වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථාව මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊ වන ව්‍යවස්ථාව ලෙස බලපැවැත්විය යුතු යː-

"කොමිෂන් සභාවේ බලතල.

155ඊඊ. පොලිස් නිලධරයකුට හෝ පොලිස් බලකායට එරෙහිව ජනතා සාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තකුගෙන් හෝ ලැබෙන පැමිණිලි භාරගැනීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවට බලතල ලබාදිය යුතු අතර, පාර්ලිමේන්තුව මගින් පනවන ලද යම් නීතියක විධිවිධානවලට අනුකූලව ඒ සම්බන්ධයෙන් සහන සැලසිය යුතු වන්නේ ය. මේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින්, ජනතා සාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තකුගෙන් ලැබෙන පැමිණිලි භාරගැනීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා කාර්ය පටිපාටි ස්ථාපිත කිරීමට රීති සාදනු ලැබිය හැකි වන්නේ ය.".

**48.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**49.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඌ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඌ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**50.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**51.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**52.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඔ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඔ වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**53.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

"දැනට බලපවත්නා රීති සහ නියෝග ශේෂ කිරීම.

155ඕ. මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී පොලිස් නිලධරයන්ට අදාළව බලාත්මකව පවතින සියලු රීති, නියෝග සහ කාර්ය පටිපාටි, මෙය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රීති, නියෝග සහ කාර්ය පටිපාටි සාදනු ලබන තෙක්, නොකඩවා බලාත්මකව පැවතිය යුත්තේ ය.".

**54.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(2) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය. ඒ කොමසාරිස්වරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධුරය දැරිය යුත්තේ ය.";

(2) ඒ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(5) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට සිය ධුරයෙහි කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමට නොහැකි වූ කවර හෝ විටක ඒ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙනුවෙන් වැඩබැලීමට තැනැත්තකු 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේ ය.".

XIXඅ වන පරිච්ඡේදය ඉවත් කිරීම.

**55.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIXඅ වන පරිච්ඡේදය (156අ වන ව්‍යවස්ථාව) මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIXආ වන පරිච්ඡේදය ඉවත් කිරීම.

**56.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIXආ වන පරිච්ඡේදය (156ආ වන ව්‍යවස්ථාවේ සිට 156ඌ වන ව්‍යවස්ථාව දක්වා) මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**57.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව, එහි "රජයේ නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපනය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" "රජයේ නිලධරයා" යන්නෙන්, අධිකරණ නිලධරයකු හැර ජනරජය යටතේ වැටුප් ලබන ධුරයක් දරන තැනැත්තෙක් අදහස් වේ ; එහෙත් ඊට-

(අ) ජනාධිපතිවරයා;

(ආ) අග්‍රාමාත්‍යවරයා;

(ඇ) කථානායකවරයා;

(ඈ) 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලැබූ අමාත්‍යවරයෙක්;

(ඉ) 46 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ නියෝජ්‍ය අමාත්‍යවරයෙක්;

(ඊ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

(උ) පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයෙක්;

(ඌ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(එ) 41අ වන ව්‍යවස්ථාවේ සඳහන් යම් කොමිෂන් සභාවක සාමාජිකයෙක්;

(ඒ) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා;

(ඔ) මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ කොමිෂන් සභාවට පත් කරනු ලැබූ නිලධරයන්;

(ඕ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;

(ක) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;

(ග) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ච) රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ජ) විගණකාධිපතිවරයා; සහ

(ට) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්),

ඇතුළත් නොවන්නේ ය;".

**58.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී- *අන්තර්කාලීන විධිවිධාන.*

(i) අග්‍රවිනිශ්චයකාරවරයා;

(ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(iii) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්;

(iv) අභියාචනාධිකරණයේ සභාපතිවරයා;

(v) අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(vi) නීතිපතිවරයා;

(vii) විගණකාධිපතිවරයා;

(viii) පොලිස්පතිවරයා;

(ix) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්);

(x) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;

(xi) මහාධිකරණයේ විනිශ්චයකාරවරයන්; හෝ

(xii) අධිකරණ නිලධරයන්, උපලේඛනගත රජයේ නිලධරයන්, රජයේ නිලධරයන් හෝ පොලිස් නිලධරයන්,

වශයෙන් ධුර දරන සෑම තැනැත්තකු ම ඔහු කලින් ඉල්ලා අස්වුවහොත්, මියගිය හොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, තවදුරටත් එම ධුර දරනු ලැබිය යුතු අතර, එම නියම හා කොන්දේසි යටතේ ම එම ධුරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු වන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයකු ලෙස ධුර දරන සෑම තැනැත්තකු ම මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර දැරීම නතර කළ යුත්තේ ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී-

(අ) මැතිවරණ කොමිෂන් සභාවේ;

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ;

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ;

(ඈ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ;

(ඉ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ;

(ඊ) මුදල් කොමිෂන් සභාවේ; සහ

(උ) සීමා නීර්ණය කොමිෂන් සභාවේ,

සභාපතිවරයා හෝ සාමාජිකයකු ලෙස ධුර දරන සෑම තැනැත්තකු ම, ඔහු කලින් ඉල්ලා අස්වුවහොත්, මිය ගියහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, VIIඅ වන පරිච්ඡේදයට අනුකූලව ඒ අදාළ කොමිෂන් සභා ස්ථාපිත කරනු ලබන දිනය තෙක් තම අදාළ ධුරවල බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම දිගටම කරගෙන යනු ලැබිය යුත්තේ ය.

(4) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී-

(අ) විගණන සේවා කොමිෂන් සභාවේ; සහ

(ආ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ,

සභාපතිවරයා හෝ සාමාජිකයකු ලෙස ධුර දරන සෑම තැනැත්තකු ම මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි ඒ ධුර දැරීම නතර කළ යුත්තේ ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද -

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විගණන සේවා කොමිෂන් සභාව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව හෝ පවරනු ලැබ, විනිශ්චයට භාජනය වෙමින් පවත්නා සියලු නඩු, පැමිණිලි, නඩු පැවරීම්, නීති කෘත්‍ය, කාරණා හෝ දේ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් හෝ රජයට එරෙහිව පවරනු ලැබූ නඩු, පැමිණිලි, නඩු පැවරීම්, නීති කෘත්‍ය, කාරණා හෝ දේ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් යම් නඩුවක දී, කාරණයක දී, නීති කෘත්‍යයක දී හෝ වෙනත් දෙයක දී විගණන සේවා කොමිෂන් සභාව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙනුවෙන් හෝ ඒවාට එරෙහිව දෙන ලද යම් තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ ප්‍රදානයක් රජය වෙනුවෙන් හෝ රජයට විරුද්ධව දෙන ලද තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ ප්‍රදානයක් ලෙස සලකනු

ලැබිය යුතු අතර, ඒ අනුව බලාත්මක කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විගණන සේවා කොමිෂන් සභාව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සතු වන සියලු චංචල සහ නිශ්චල දේපළ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි රජය සතු විය යුතු අතර, ඒ දේපළ රජයේ දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විගණන සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයන්ගේ පත් කිරීම්, උසස්වීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම් පිළිබඳ සියලු කාරණා ඒ දින සිට බලපැවැත්වෙන පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඒවා සම්බන්ධයෙන් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(7) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජාතික පොලිස් කොමිෂන් සභාව ඉදිරියේ නොවිසඳී පවත්නා-

(අ) පොලිස් නිලධරයන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම් සම්බන්ධ සියලු කාරණා; සහ

(ආ) පොලිස් නිලධරයන් විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද සියලු අභියාචනා,

ඒ දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

සැක දුරු කිරීම.

**59.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය හෝ අනුමතය ලබා ගැනීම සඳහා යම් ලිඛිත නීතියකින් නියම කර ඇති අවස්ථාවක දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කරනු ලබන ඒ සඳහන, පාර්ලිමේන්තු සභාවට කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු යයි සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**60.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.